**ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව**

-------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජසේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුලි 15 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තෙමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සමාජසේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට ආරම්භක මූල්‍ය නොවන වත්කම් ශේෂය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව රු.430,274,243 ක් වූ අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු **“ SA 82”** වාර්තාවට අනුව රු.380,465,465 ක් වූයෙන් රු. 49,808,778 ක වෙනසක් විය.<br>මූල්‍ය නොවන වත්කම් ශේෂයන්හි ඉහත දැක්වුණු වෙනස්කම් සම්බන්ධයෙන් අංක 2021/02 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.9 ඡේදයේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තු පොත්වල ශේෂයන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයෙහි කේවල ලෙජර් සමඟ සසඳා නිරවුල් කර මූල්‍ය නොවන වත්කම් වල ගිණුම්මය නිවැරදිතාවය පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ **SA 82** වාර්තාවේ හා මූල්‍ය ප්‍රකාශනයන්හි **9160** යටතේ වූ අගයන් අතර වෙනස ලෙස දක්වා ඇති රු.**49,623,468** ට හේතුව වන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන ලබාදීමෙන් සිදුකළ**,** දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි ඉදිකිරීම් සඳහා වූ වියදම් **New CIGAS** වැඩසටහනනේ ආරම්භක ශේෂයන් **(Opn_Bal_Add)** ලෙස වර්ෂ අවසානයේ ඇතුලත් කිරීමයි.<br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ **SA 82** වාර්තාවේ හා මූල්‍ය ප්‍රකාශනයන්හි **9152** යටතේ වූ අගයන් අතර වෙනස ලෙස දක්වා ඇති රු.**129,580** ට හේතුව වන්නේ වර්ෂය තුළදී ඇතුලත් කරන ලද පෙර වර්ෂයන්ට අදාල යන්ත්‍ර හා උපකරණවල වටිනාකමයි. එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ **SA 82** ට අනුව ආරම්භක ශේෂ එකතුවීම් ලෙස රු.**129,580** **(Opn_Bal_Add)** ලෙස සඳහන් වී ඇති අතර අවසන් ගිණුම් සකස් කිරීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා ඒ දෙකෙහි එකතුව ලෙස රු.**95,791,487** ක් දක්වා ඇති බව සඳහන් කරමි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය පරිදි දෙපාර්තමේන්තුවේ පොත්වල ශේෂයන් හා භාණ්ඩාගාර ගිණුම්වල ශේෂයන් සසඳා මූල්‍ය නොවන වත්කම් වල ගිණුම්මය නිවැරදිතාවය පවත්වාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ගොඩනැගිලි හා ඉදිකිරීම්, කෙරීගෙන යන වැඩ සඳහා සමාලෝචිත වර්ෂයේදී දැරූ රු.49,691,458 ක් වූ මූලධන වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | කාර්යාල ගොඩනැගිලිවලට අදාල මිල දී ගැනීම් රු.49,623,468 වටිනාකම වෙනත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම වෙ.වර්ෂය තුල දී නිදහස් කරන ලද ප්‍රතිපාදන වල වටිනාකමට අදාල බිල්පත් එම ආයතන වලින් ලබා ගෙන සිගාස් වැඩසටහන හරහා වත්කම් ලෙස ගිණුම් ගත කර ඇති අතර එම අගය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (Opn_Bal_Add) යටතේ හා මූල්‍ය වාර්තාහි ආරම්භක ශේෂ යටතේ සටහන් වී ඇත. | වර්ෂයේදී දැරූ මූලධන වියදම් මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| **(iii)** | දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතන , පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම් සම්පූර්ණ කර ගොඩනැගිලි භාවිතයට ගෙන තිබියදීත්, ඉදිකිරීම් වෙනුවෙන් ඉකුත් වර්ෂවලදී දැරූ පිරිවැය කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.එකී ඉදිකිරීම් සම්පූර්ණ කළ ගොඩනැගිලි පිරිවැය හඳුනාගෙන ගණනය කර මූල්‍ය ප්‍රකාශන වල ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. ගොඩනැගිලි හා ඉදිකිරීම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳව 2021 දෙසැම්බර් 31 දිනට විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවායේ පිරිවැය හඳුනාගැනීම හා පිරිවැය ගණනය කළ ආකාරය පරීක්ෂා කල නොහැකි විය. | ඉදිකිරීම් සම්බන්ධයෙන් දරණ වියදම් ඒ ඒ බිල්පත් ඉදිරිපත් කිරීමේදී කෙරී ගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කරන අතර සියළු ඉදිකිරීම් අවසන් වූ පසු එම වටිනාකම ගොඩනැඟිල්ලක් ලෙස ගිණුම් ගත කිරීම ක්‍රමවේදය වන අතර විගණනය විසින් දක්වා ඇති ගොඩනැඟිලි වලට අදාලව තවමත් ඉදිකිරීම් කටයුතු අවසන්ව නොමැති බැවින් එම වත්කම් ගොඩනැඟිල්ලක් ලෙස ගිණුම් ගත කිරීම ගැටළුකාරී තත්වයකි. එබැවින් සියළු ඉදිකිරීම් අවසන් වූ පසු කෙරීගෙන යන වැඩ වල එකතුව ගොඩනැඟිල්ලක් ලෙස ගිණුම් ගත කිරීමේ කටයුතු සිදු කරන බව දන්වමි. | ඉදිකිරීම් සම්පූර්ණ කල ගොඩනැගිලි පිරිවැය මූල්‍ය ප්‍රකාශන වල ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයන් 05 ක් සඳහා සලසාගෙන තිබුණු වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන එකතුව රු.9,800,000ක් විය. එම වැය විෂයන්ගෙන් රු.2,135,000ක් වූ ප්‍රතිපාදන මු.රෙ.66 මඟින් වෙනත් වැය විෂයන්ට මාරුකර තිබියදීත්, එකී වැය විෂයයන් වල ඉතිරිය පිළිවෙලින් සියයට 9 සිට සියයට 54 දක්වා පරාසයක විය. | රටෙහි පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් මෙහි සඳහන් වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරි වූ අතර එම ඉතිරි ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා මු.රෙ.66 මාරු කිරීම මඟින් ප්‍රතිපාදන ලබා ගන්නා ලදී. | ප්‍රමාණය ඉක්මවා ප්‍රතිපාදන සලසා නොගෙන පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයන් 09 ක් සඳහා සලසාගෙන තිබුණු රු.358,200,000 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයන්ගෙන් රු.42,500,000 ක ප්‍රතිපාදන රැස්කරගෙන තිබුණි. එසේම වෙනත් පුනරාවර්තන වැය විෂයන් 14 ක් සඳහා සළසාගෙන තිබුණු රු.250,350,000 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරිවීම් හේතුවෙන් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කරගෙන තිබුණි. | 2021 වර්ෂය තුලදී රටෙහි පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් වෘත්තීය පුහුණු ආයතන වසා දැමීම නිසා වැය විෂයයන් වල ප්‍රතිපාදන විශාල වශයෙන් ඉතිරි විය. එබැවින් අතිරේක ප්‍රතිපාදන වල අවශ්‍යතාවය පැන නැගුන අවස්ථාවක අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමකින් තොරව අනපේක්ෂිත ලෙස ඉතිරි වූ ප්‍රතිපාදන උපයෝගි කර ගන්නා ලදී. | වැය විෂයයන් සඳහා ප්‍රශස්ථ පරිදි වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදනය සලසා ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයේ 3.3 ඡේදය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.94 විධිවිධාන පරිදි එළඹී තිබුණු බැඳීම් හා බැරකම් හෙළිදරව් කළ යුතු වුවත්, වැය විෂයයන් 05 කට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට එළඹී තිබුණු | වැය විෂය අංක 216-02-03-1203 ට අදාළ රු. 120,000 ක බැරකම් මෙම දෙපාර්තමේන්තුවේ ලේඛනවලට අනුව නිවැරදිව හඳුනාගත නොහැකි විය.<br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක. 2012/02 අනුව බැඳීම් හා බැරකම් නව | මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි එළඹී තිබුණු බැඳීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.2,433,292 ක් වූ බැරකම් හා බැඳීම් බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කිරීම 2022 ජනවාරි 31 දිනට පෙර සිදුකිරීමට උපදෙස් දී තිබූ බැවින්, ඒ දක්වා මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ බැරකම් පමණක් ගිණුම් ගත කරන ලදී. එබැවින් ඊට පසු ගෙවීමට ඉදිරිපත් වූ බැරකම් වටිනාකම් බැරකම් ප්‍රකාශයේ දක්වා නැත. | |
| (ආ) | වැය විෂයයන් 06කට අදාලව ප්‍රතිපාදන ඉතිරිවීම් එකතුව රු.2,334,751ක් වූ අතර එම වැය විෂයයන් සඳහා 2021 දෙසැම්බර් 31 දිනට බැරකම් එකතුව රු.8,249,966 ක් වූයෙන් ප්‍රතිපාදන ඉක්මවූ බැරකම් වටිනාකම රු.5,915,215 ක් විය. | ප්‍රධාන කාර්යාලයට අමතරව ලංකාව පුරා වෘත්තීය පුහුණු ආයතන පිහිටා තිබීම හේතුවෙන් හා අත්‍යාවශ්‍ය ඇතැම් කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුවෙන් ප්‍රතිපාදන කළමනාකරණය හා බිල්පත් ගෙන්වා ගැනීමේදී පාලනය කිරීමට නොහැකි ඇතැම් ගැටළුවලට මුහුණ පෑමට සිදු වූ බැවින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹීමට සිදු විය. | ප්‍රතිපාදන නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) මු.රෙ.1646 | - | වාහන භාර නිලධාරී විසින් වාර්තා ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊලඟ මාසයේ 15 වන දිනට පෙර දෙපාර්තමේන්තුවේ වාහන ධාවනය | ඉදිරියේදී නියමිත පරිදි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි පරිදි වාහන ධාවන මාසික සාරාංශ හා ධාවන සටහන් විගණනයට |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් මාසික සාරාංශ හා ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | ඉදිරිපත් කළ යුතුය. |
| (ii) මු.රෙ.104(3) | 68,850 | දෙපාර්තමේන්තුවේ වාහනයකට අනතුරකින් සිදු වූ අලාභ හානි සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ මෙමදෙපාර්තමේන්තුවේ සිදු වූ රිය අනතුරු සම්බන්ධයෙන් සියළුම අළුත්වැඩියා වියදම අදාල රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කර ඇත. මේ වන විට සියළු රථවාහන අනතුරු සඳහා මු.රෙ.104(3) පරීක්ෂණ සිදු කරනු ලබයි. | මුදල් රෙගුලාසි පරිදි වාහන අනතුරුවලින් සිදුවන අලාභහානි සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) මු.රෙ.757(2) | ගණනය කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ තුනකදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ ඌනතා අතිරික්තතා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීමට ඉකුත් වර්ෂ වලදී විගණන වාර්තා මඟින් පෙන්වා දී තිබුණ ද, ඒ පිළිබඳව අවධානය යොමු වී නොතිබුණි. | ඌනතාවයන් සඳහා හේතු විමසා ආයතනය දැනුවත් කර ඇති අතර අතිරික්තතා පොත්වලට ඇතුලත් කර ගන්නා ලෙස දැනුවත් කර ඇත. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ ඌනතා අතිරික්තතා සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 2.4 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2020** අගෝස්තු **28** දිනැති අංක **01/2020** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ **4.1** ඡේදයේ විධිවිධාන පරිදි අදාල නිලධාරීන් හට මසකට රු.**1000** ක උපරිමයකට යටත්ව දූරකතන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට උපදෙස් ලබාදී තිබුණ ද, ඊට පටහැනිව අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රෝහල් ආශ්‍රිතව පිහිටුවා තිබුණු වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල අනුයුක්තව සේවය කරන දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන්ට හා සංවර්ධන නිලධාරීන්ට මාසිකව දූරකතන දීමනාවක් ලෙස රු.**1000** ක මුදලක් **2020** සැප්තැම්බර් සිට ගෙවා තිබුණි. මේ අනුව විධිමත් අධිකාරී බලයකින් තොරව **2020** වර්ෂයේදී නිලධාරීන් **238** දෙනෙකුට රු.**238,000** ක්, **2021** වර්ෂයේදී නිලධාරීන් **391** දෙනෙකුට රු.**4,695,000** ක් ද, වශයෙන් එකතුව රු. 4,933,000 ක් දූරකතන දීමනා ගෙවා තිබුණි.<br>තව ද, වෘත්තීය පුහුණු ආයතන, ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථාන හා මත්ලෝලී පුහුණු මධ්‍යස්ථාන වල සේවයේ නියුතු දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන් 31 කට **2021** මාර්තු සිට **2022** මාර්තු දක්වා කාලය තුල දූරකතන දීමනා වශයෙන් රු.**372,000** ක් ගෙවා තිබුණි. | සමාජ සේවා නිලධාරීන්ගේ සංගමයේ ඉල්ලීම අනුව දූරකථන දීමනාවක් ගෙවීමට අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලැබී ඇත.<br>සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ රෝහල් වලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරින් සඳහා අදාළ දීමනාව ලබා දීම අනුමත කර ඇත. තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ රෝහල් වලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරින් සඳහා රු.**1,000** ක දූරකථන දීමනාවක් ගෙවන බව දන්වා අනෙක් නිලධාරින් වෙතද දීමනාව ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර එය වැටුපට ගෙවීම සඳහා අනුමැතියත් ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධානයන් පරිදි නිලධාරීන්ගේ රජකාරී දූරකථන ගාස්තු විධිමත් ලෙස ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2020** අගෝස්තු **28** දිනැති අංක **02/2020** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ **03** ඡේදය ප්‍රකාරව අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වූ **2021** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් **15** දිනට පෙර පිළියෙල කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් **2021** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම එදිනට පිළියෙල කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | **2021** වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂ අවසානයේ සකස් කර සමාජ සේවා අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය පරිදි කටයුතු සිදු කරන ලද අතර ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ දැනගැනීම සඳහා **2021** අප්‍රේල් **20** දින යොමු කර ඇත. ඉදිරියේ දී මෙම අඩුපාඩුව මගහරවා ගනිමින් නියමිත කාල සීමාව තුළ නිසි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නිසි කලට පිළියෙල කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් වූ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවධානය යොමු වී නොතිබුණි.<br>➢ ආබාධ සහිත ප්‍රජාව දෛනික ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටලු අවම කිරීම සඳහා මැදිහත්වීම හා ඔවුන් සවිබල ගැන්වීම.<br>➢ සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය<br>➢ මතට ඇබ්බැහිවූවන් නේවාසික පුනරුත්ථාපනය කිරීම, ඔවුනට වෘත්තීය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම.<br>➢ විවිධ සමාජ ගැටළුවලට ගොදුරු වූ පුද්ගලයින් සඳහා නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබාදීම. | ආබාධ සහිත ප්‍රජාවගේ දෛනික ජීවිතයේ මුහුණපාන විවිධ ගැටළු අවම කිරීම සඳහා මැදිහිත්වීම හා ඔවුන් සවිබල ගැන්වීම, සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය, මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම,වෘත්තීය පුහුණුව ලබාදීම හා ඔවුන් සමාජගත කිරීම යන අංශයන් ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවූ නමුත්, එකී අංශයන්වලට අදාළව 2021 වර්ෂය තුළ මෙහෙයුම් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කෙරිණි. එසේම 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එකී අංශයන් පිළිබඳ සැලසුම් අන්තර්ගත කර ඇත. | අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් වූ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු සැලසුම් කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආබාධ සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමේ අරමුණින් ආරම්භකර තිබුණු ප්‍රජා මූලික ආබාධිත පුනරුත්ථාපන ජාතික වැඩසටහන යටතේ ජාතික මෙහෙයුම් කමිටු ඉකුත් මාස 27ක කාලය තුලදී අක්‍රීය කර තිබීම, සමාජසේවා වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම ආබාධ සහිත පුද්ගලයන්ගේ නිෂ්පාදන ප්‍රමිතිගත කිරීම හා වෙළඳපොළ හඳුන්වාදීම යනාදී කාර්යයන් ඉටුකර නොතිබීම හේතුවෙන් ආබාධ සහිත පුද්ගලයන්ගේ සංවර්ධනය, අධ්‍යාපනය, ආර්ථික හා සමාජීය අංශයන් කෙරෙහි ජාතික මට්ටමින් හිතකර තීරණ ගැනීමට අපොහොසත් වී තිබුණි. තවද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය දුර්වලවීම, ආබාධ සහිත පුද්ගලයන්ගේ නිෂ්පාදන හඳුනාගැනීම, ප්‍රමිතිගත කිරීම, පුහුණුව ලබාදීම, ප්‍රමිති නිෂ්පාදන තෝරාගැනීම හා නිෂ්පාදන ජාතික මට්ටමට ඉදිරිපත් කිරීම යනාදි අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගෙන නොතිබුණි. ප්‍රජාමූලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට රු.12,500,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල බල ප්‍රදේශ 25 සඳහා රු.7,703,248 ක් වූ ප්‍රතිපාදන පමණක් නිදහස්කර තිබුණි. නිදහස්කල ප්‍රතිපාදන වලින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීමට හා සමාලෝචනය කිරීමට ද අපොහොසත් වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ සංවරණ සීමා පනවා තිබූ බැවින් ආබාධ සහිත පුද්ගලයින් සහ නිලධාරීන් ඒකරාශී කිරීමට නොහැකි තත්ත්වයක් හමුවේ මෙම වැඩසටහන 2021 වර්ෂයේ නොපැවැත්වීමට කටයුතු කළ අතර, 2022 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ලබා ගත් ඉල්ලීම් හා ව්‍යාපෘති වාර්තා සැලකිල්ලට ගනිමින් අදාල ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කිරීමට කටයුතු කර ඇත. | ප්‍රජා මූලික ආබාධිත පුනරුත්ථාපන ජාතික වැඩසටහනෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට, සමාලෝචනය කිරීමට , ප්‍රගතිය ඇගයීමට කටයුතු කළ යුතුය. |

**3.3** **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| උතුරු - නැගෙනහිර පලාත්වන ආබාධ සහිත තරුණ, තරුණියන් සඳහා දෙමළ භාෂා මාධ්‍යයෙන් වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා **2017** වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කළ කිලිනොච්චිය වෘත්තීය පුහුණු ආයතනයේ ඉදිකිරීම් කටයුතු **2022** අප්‍රේල් **30** දින වන විටත් නිමකර නොතිබුණි. මේ හේතුවෙන් ඉලක්කගත පරිදි සමාලෝචිත වර්ෂයේදී වෘත්තීය පුහුණු කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | මෙම ආයතනයේ පාඨමාලා ආරම්භ කිරීමට සහ ආයතන කටයුතු පවත්වා ගෙන යාමට හැකි පරිදි ගොඩනැගිලි ඉදිකර ඇති අතර තවදුරටත් මුළුතැන්ගෙය හා ආපනශාලාව පමණක් ඉදිකිරීමට ඇත. | කිලිනෝච්චිය වෘත්තීය පුහුණු ආයතනයේ වෘත්තීය පුහුණු කටයුතු ආරම්භ කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

**3.4** **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත පිරිවැය රු.290,998 ක් වූ පොත් , සඟරා හා පත්‍රිකා වර්ග 07ක පිටපත් 22,460 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණි. | දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අත්දැකීම් පදනම් කර ගෙන ඔවුන් විසින් ලියන ලද ලිපි ඇතුලත් කෘති හා දෙපාර්තමේන්තුවේ කාර්යයභාරය පිළිබඳ සඳහන් පත්‍රිකා දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරනු ලබන විවිධ වැඩමුළු වලදී බෙදා දීමට කටයුතු කර ඇත. එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පුස්තකාල සඳහාද බෙදා දීමට කටයුතු කරනු ලැබේ. | පොත්, සඟරා හා පත්‍රිකා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෘත්තීය පුහුණු ආයතනවල පුස්තකාල සඳහා 2019 වර්ෂයේදී රු.130,815 කට මිලදීගත් කාව්‍ය ග්‍රන්ථ, පරිවර්තන කෘති, නවකතා යනාදී පොත් 288 ක් පුස්තකාලවල පරිහරණය සඳහා නිකුත් කිරීමෙන් තොරව වර්ෂ 02කට වැඩි කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි. | 2019 වර්ෂයේදී මිලදී ගත් කාව්‍ය ග්‍රන්ථ, පරිවර්ථන කෘති හා නවකථා ඉදිරියේදී වෘත්තීය පුහුණු ආයතන වල පුස්තකාල සඳහා බෙදා දීමට කටයුතු කරන බව දන්වමි. | මිලදී ගත් කාව්‍ය ග්‍රන්ථ, පරිවර්තන කෘති, නවකතා ආදිය පුස්තකාල වල පරිහරණය සඳහා නොපමාව නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබුණු අක්කර 33 ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම් 05 ක් පරිත්‍යාග කර වර්ෂ 10 කට වැඩි දීර්ඝ කාලයක් ඉකුත් වී තිබුණද, ඒවායේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කර එකී ඉඩම්වල හා එහි ඉදිකර තිබුණු ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කරවාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වෘත්තීය පුහුණු ආයතන, කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන, පුනරුත්ථාපන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබූ ඉඩම් ප්‍රමාණවලින්, සීදුව වෘත්තීය පුහුණු ආයතන සතු ඉඩම මේ වන විට පවරාගෙන තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කිරීමේ කටයුතු අවසන් කර අපවෙත යොමු කර ඇති අතර ඉදිරියේ දී එය ගිණුම්ගත කිරීමට නියමිතව ඇත. දෙපාර්තමේන්තුව වෙත ඉඩම් නිත්‍යානුකූලව පවරා ගැනීම් සඳහා දීර්ඝ ක්‍රියාවලියක් අනුගමනය කළ බැවින් ඉතිරි ඉඩම් පවරා ගැනීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින අතර එම ඉඩම් නීත්‍යානුකූල ලෙස පවරා ගැනීමෙන් පසුව තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගෙන එහි පිහිටි ගොඩනැගිලි ද ඇතුලත් තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වෘත්තීය පුහුණු ආයතන 11ක් ස්ථාපිත කර තිබුණු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබීම හා වටිනාකම තක්සේරු කර නොතිබීම හේතුවෙන් ඉකුත් වර්ෂ 10 කට වැඩි කාලයක් තුල ඉදිකර තිබුණු ගොඩනැගිලි, මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත නොකර ගිණුම්වලින් අත්හැර තිබුණි. | වෘත්තීය පුහුණු ආයතන වල ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර අදාල වටිනාකම් ලබාදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති අතර මේ වන විට ආයතන දෙකක තක්සේරු අගයන් ලැබී ඇත.ඉතිරි ආයතන වල ඉඩම් හා ගොඩනැගිලි වල තක්සේරු අගයන් ලැබුනු පසුව අදාල වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. | වෘත්තීය පුහුණු ආයතන ස්ථාපිත කර තිබුණු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරාගෙන තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 පාඩු හා හානි**

---------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ සමාලෝචිත වර්ෂයේදී සිදුකළ සොරකමකින් අස්ථානගත වූ වටිනාකම රු.50,000 ක් වූ රූපවාහිනී යන්ත්‍රය සම්බන්ධයෙන් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. | සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ සොරකමට අදාලව මු.රෙ.104(3) යටතේ අලාභයන් පිළිබද ප්‍රාරම්භක වාර්තාව අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. රා.මු.ච. 01/2020 අනුව මෙම හානිය ගණන්දීමේ නිලධාරියාගේ මූල්‍ය අධිකාරී සීමාව තුල පවතින බැවින් අදාල පාර්ශවයෙන් අයකර ගැනීමේ නියෝගයක් දෙපාර්තමේන්තු ප්‍රධානීගෙන් ලබා ගැනීමටත් නියෝගය ලද පසු ඉදිරි කටයුතු කිරීමටත් නියමිතය. මේ වන විට හානි ලේඛනයට ඇතුලත් කර ඇත. | සොරකමකින් අස්ථානගත වූ වත්කම් සම්බන්ධයෙන් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | රාගම වෘත්තීය පුහුණු ආයතනයේ ඉකුත් වර්ෂයේදී සිදුකර තිබුණු සොරකමින් වටිනාකම රු.**70,800** ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අයිතම **06** ක් අස්ථානගත වී තිබුණි. එකී අලාභය පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණු අතර මු.රෙ.104 විධිවිධාන ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු ක්‍රියාත්මක කිරීමට ද පියවර ගෙන නොතිබුණි. | රාගම වෘත්තීය පුහුණු ආයතනයේ සොරකමට අදාලව මු.රෙ.104(4) යටතේ අලාභයන් පිළිබද අවසන් වාර්තාව අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. රා.මු.ච. 01/2020 අනුව මෙම හානිය ගණන්දීමේ නිලධාරියාගේ මූල්‍ය අධිකාරී සීමාව තුල පවතින බැවින් අදාල පොත් වලින් කපා හැරීමේ නියෝගයක් දෙපාර්තමේන්තු ප්‍රධානීගෙන් ලබා ගැනීමටත් නියෝගය ලද පසු ඉදිරි කටයුතු කිරීමටත් නියමිතය. මේ වන විට හානි ලේඛනයට ඇතුලත් කර ඇත. | සොරකමකින් අස්ථානගත වූ වත්කම් සම්බන්ධයෙන් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හෙළිදරව් කිරීමටත් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු ක්‍රියාත්මක කිරීමටත් කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) | භාවිතයට නොගෙන දෙපාර්තමේන්තු ප්‍රධාන ගබඩාවේ වර්ෂ **03** සිට වර්ෂ **08** දක්වා දීර්ඝ කාලයක් ගබඩා කර තිබුණු පාරිභෝජ්‍ය ද්‍රව්‍ය අයිතම **24**ක් කල්ඉකුත් වීම හා විනාශ වීම හේතුවෙන් හානියට පත් වී තිබුණි. හානි වූ තොග සම්බන්ධයෙන් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ | භාවිතයට ගත නොහැකි පාරිභෝජ්‍ය ද්‍රව්‍ය **6**ක් පමණක් හදුනා ගත් අතර ඒවා **2020** වර්ෂයට අදාල ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ වෙන්දේසියේදී වෙන්දේසි කර ඇත. | කල්ඉකුත් වීම හා විනාශ වීම හේතුවෙන් හානියට පත්වූ තොග පිළිබඳව අත්හැරීම් ප්‍රකාශයේ හෙළිදරව් කළ යුතු අතර එකී තොග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

හෙළිදරව් කර නොතිබුණි. එකී තොග හානි ගණනය කර මුදල් රෙගුලාසි **108** විධිවිධාන පරිදි පොත්වලින් කපා හැරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හෝ පියවර ගෙන නොතිබුණි.

## 3.6 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2016** වර්ෂයේ සිට **2018** වර්ෂය දක්වා වර්ෂ **02** ක පමණ කාලයක් ධාවනයෙන් ඉවත්කර තිබුණු වෑන් රථයක් **2018** වර්ෂයේදී අපහරණය කිරීමට තීරණය කර පසුව අලුත්වැඩියා කර භාවිතා කිරීමට සුදුසු බව **2019** වර්ෂයේදී තීරණය කර තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේදී අලුත්වැඩියා කටයුතු සිදු කර තිබුණි. ඒ සඳහා රු.**320,020** ක වියදමක් දරා තිබුණ ද **2022** අප්‍රේල් **30** දින වන විටත් වෑන් රථය ධාවනයට සුදුසු තත්ත්වයට පත්කිරීමට අපොහොසත් වී තිබුණි. | මෙම රථය ධාවනයට සුදුසු තත්ත්වයට පත් කර ගැනීමට තාක්ෂණ නිලධාරීගේ නිර්දේශ අනුව අදාල අළුත්වැඩියාවන් සිදු කල අතර ඇස්තමේන්තුවට කමිටුවක් විසින් නිර්දේශ ලබා දී තිබේ. අළුත්වැඩියාවන් නිසි පරිදි සිදුවී ඇති බවට තාක්ෂණ නිලධාරී තහවුරු කර ඇත. ඉතිරි අළුත්වැඩියා සඳහා වන වියදම දැනට පවතින ප්‍රතිපාදන සීමාව තුළ දැරිය නොහැකි බැවින් කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත මෙම රථය ලබා ගැනීමට කැමති ආයතනයක් වෙත එය ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් දන්වා ඇත. | වෑන් රථය අලුත්වැඩියා කර ධාවනයට සුදුසු තත්ත්වයට පත්කර ගත හැක්කේ නම් කඩිනමින් අලුත්වැඩියා කටයුතු නිමකළ යුතු අතර එසේ නොහැක්කේනම් අපහරණ කටයුතු සිදු කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | **1956** වර්ෂයේ සිට **2021** වර්ෂය දක්වා වර්ෂ **65** ක කාලය තුල ස්ථාපිත කර තිබුණු වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන **14** ක ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට ඉතා දීර්ඝ කාලයක් ගතවී තිබුණද අපොහොසත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් අංක **04/2018** හා **02/2019** දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ වලින් හඳුන්වාදී තිබුණු මාර්ගෝපදේශයන් කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය ප්‍රමාණාත්මක ලෙස යොමු වී නොතිබුණි. තව ද විධිමත් ලෙස නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමෙන් තොරව ගොඩනැගිලි | මේ වන විට ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි විධිමත් ලෙස පවරා ගැනීම් අවසන් ඉඩම් සංඛ්‍යාව **08** කි. ඒ අනුව ඉතිරි ඉඩම් ප්‍රමාණයන් පවරා ගැනීම් කටයුතු වලට අදාල එම ඉඩම් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් කටයුතු කරමින් පවතී. | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමට කටයුතු කර ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් රජයේ ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා ඉකුත් වර්ෂ **05** ක කාලය තුල රු.මිලියන **500** කට අධික රජයේ මුදල් වැයකර තිබුණි.

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ලබාදීම හා කුසලතා වර්ධනය කිරීම, නව වෘත්තීය පුහුණු ආයතන ඉදිකිරීම, මුල් ළමාවියේ පසුවන ආබාධිත සහිත දරුවන්ගේ ආබාධ අවම කිරීමට මැදිහත් වීම යටතේ වූ ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ කාර්යසාධන ප්‍රගතිය සියයට 60 ක සාමාන්‍යය අගයක් විය. | ඡේදයේ සඳහන් ඉලක්ක සාක්ෂාත් කිරීමේ ප්‍රගතිය සියයට 60 ක සාමාන්‍ය අගයක් ගනු ලැබූ අතර, ඒ සඳහා කොවිඩ් 19 වසංගය පැතිරයාම තුළින් රට තුල පැවති තත්වය හේතු විය. | ඉලක්කගත කාර්යයන් වල ප්‍රමාණවත් කාර්යසාධන ප්‍රගතියක් පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා සෘජු ලෙස කටයුත ක්‍රියාත්මක කරන තෘතීයික සේවා සනයේ ස්ථාන භාර නිලධාරී තනතුරු 05ක්, ද්විතියික සේවා සනයේ තනතුරු 50 ක් හා ප්‍රාථමික සේවා සනයේ තනතුරු 06ක් වශයෙන් එකතුව 61ක් පුරප්පාඩු වශයෙන් පැවතිණි.<br>පුරප්පාඩු වූ ස්ථාන භාර නිලධාරී තනතුරු 05ක් පිරවීම සඳහා 2020 වර්ෂයේදී අයදුම්පත් කැඳවා කටයුතු ආරම්භකර තිබුණ ද , බඳවාගැනීම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී සිදුවී තිබුණු දීර්ඝ කාල ප්‍රමාදයන් හේතුවෙන් මෙතෙක් බඳවාගැනීමට අපොහොසත්ව තිබුණි. | ස්ථාන භාර නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති බැවින් ස්ථානභාර නිලධාරී තනතුරු 05 ක් සඳහා බඳවා ගැනීමට අදාළ අයදුම්පත් ද ලැබී ඇත. සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදු කර තිබුණ ද මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම කල් තැබීම හේතුවෙන් මේ වන තෙක් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවති. | දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා සෘජු ලෙස කටයුතු ක්‍රියාත්මක කරන පුරප්පාඩු කාර්යය මණ්ඩල බඳවාගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තෘතියික සේවා සනයේ සමාජ සේවා නිලධාරී තනතුරු 225ක පුරප්පාඩු පැවති අතර එය අනුමත කාර්යය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස සියයට 47ක් විය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු විසින් සමාජ සේවා නිලධාරී තනතුරු 480 ක් අනුමත කර ඇති අතර එහි උපදෙස් අනුව බඳවා ගැනීම් කටයුතු සිදුකරමින් පවතී. | පුරප්පාඩු වූ සමාජ සේවා නිලධාරී තනතුරු වලට බඳවා ගැනීම් කටයුතු කඩිනම් කළ යුතුය. |